# 2017.11.15 - 2017.11.22 දක්වා
# මලයාසියා හා සිංගප්පූර් සංචාරය

## විදුහල්පති විදේශීය කෙටිකාලීන පුහුණු










**පී.ආර්.එම්.ඒ ගමිලත්,**
**බප/හෝ/නියදගල විද්‍යාකීර්ති විද්‍යාලය**
**නියදගල**

# පටුන

පිටු අංකය


| | |
|---|---|
| 01. හැඳින්වීම | 3 |
| 02. ස්තුතිය | 4 |
| 03. පදනම | 5 |
| 04. සුවිශේෂ අරමුණු | 6 |
| 05. මලයසියා අධ්‍යාපනයේ ගුණාත්මක භාවය | 7 |
| 06. අදහස් හා යෝජනා | 10 |
| 07. ශ්‍රී ලංකාවේ දැනට පවතින අධ්‍යාපනික තත්ත්වය වැඩි දියුණු කිරීමට ඉදිරිපත් කළ හැකි ව්‍යාපෘති | 12 |
| 08. තම වෘත්තිය සංවර්ධනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග | 14 |

# හැඳින්වීම

ගරු අධ්‍යාපන අමාත්‍ය නීතීඥ අකිල විරාජ් කාරියවසම් මැතිතුමාගේ පූර්ණ මැදිහත් වීම හා උපදේශකත්වය අනුව ගරු අධ්‍යාපන ලේකම් සුනිල් හෙට්ටිආරච්චි මැතිදුන්ගේ පූර්ණ නියාමනය යටතේ අධ්‍යාපන අමාත්‍යංශයේ මානව සම්පත් සංවර්ධන අංශය හා විදේශ අංශය එක්ව සංවිධානය කරනු ලැබූ 2016/2017 නවක විදුහල්පතිවරු විදේශ කෙටිකාලීන පුහුණු කිරීම සඳහා 2017.11.15 සිට 2017.11.22 දක්වා මලයාසියා හා සිංගප්පූර් සංචාරය, ජාතික මානව සම්පත් සංවර්ධන සභාව එක්ව සංවිධානය විය.

නවක විදුහල්පතිවරු දිශාභිමුඛ කිරීමේ පුහුණුවෙන් අනතුරුව පවත්වන ලද විභාගයේ ප්‍රතිඵල ( ජාතික අධ්‍යාපන ආයතනය මගින් ) හා දිශාභිමුඛ කිරීමේ පුහුණුව අතර තුර ඉදිරිපත් කළ චරිැබඑඑසදබ එකෙහි ප්‍රතිඵල මත විදේශ කෙටිකාලීන පුහුණු කිරීම සඳහා තෝරා ගන්නා ලදී.

මෙම ප්‍රධාන පරමාර්ථය පෙරදැරි කරගෙන අප සඳහා මලයාසියාවේ ඔහෂඩෑසීෂඔශ ජඔඔසෘ හි දී බෑෘසීයෂජ ජසෘධඨසෘඑඑෑ ධහ ් ක්‍යධධබ ඊෑෘ එහධෑඑෑහඔ යන තේමාව පදනම් කරගෙන දින 08ක සාර්ථක පුහුණුවක් ලබා දෙන ලදී.එහි දී මලයාසියා අධ්‍යාපනය, එය පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ආකාරය. මලයාසියාවේ අධ්‍යාපනය යටතේ පවතින වෘත්තීය අධ්‍යාපනය, නව අධ්‍යාපන කළමනාකරණ ප්‍රවේශයන් හා විසිඑක් වන සියවසේ අධ්‍යාපනිකයා කෙසේ විය යුතු ද යන්න මූලික අවබෝධයක් ලැබුනි.

මෙම වාර්තාව මගින් මම ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නේ මලයාසියාවේ දී අධ්‍යයනය කරන ලද අධ්‍යාපන තාක්ෂණය, ක්‍රම විධි හා ක්‍රම ශිල්ප, පාසල් ප්‍රතිපත්ති මෙන්ම අධ්‍යාපනික වෘත්තික සංවර්ධනය හා එහි වෘත්තීය අධ්‍යාපනය අප රටට සුදුසු ආකාරයට යොදා ගැනීමට අපි පෙළඹිය යුත්තේ කෙසේද යන්නයි.

බොහොමයක් කරුණු යෝජනා ලෙසත් සමහර අවස්ථාවලදී අප කළ යුක්ත ලෙසත් ඉදිපත් කිරීමට උත්සහා කළෙමි.

අපේ කණ්ඩායමට නවක විදුහල්පතිවරුන් පමණක් ඇතුළත් කර ගැනීමත් අපගේ වගකීම් අපටම පවරා විදේශ පුහුණුවට යැවීමත් නිසා අමාත්‍යංශය බලාපොරොත්තු වූ නායකත්ව පුහුණුව ලැබුණු බවත් සඳහන් කරන්නේ ඉතාම නිහතමානි ස්තුති පූර්වයෙනි.

විදුහල්පති විදේශීය කෙටිකාලීන පුහුණුව

අප සඳහා ලබාදුන්

## ගරු අධ්‍යාපන අමාත්‍ය

## නීතීඥ අකිල විරාජ් කාරියවසම් මැතිදුන්

### ගරු අධ්‍යාපන ලේකම්

### සුනිල් හෙට්ටිආරච්චි මැතිදුන්

ඇතුළු සියලුම දෙනාට

අපගේ කෘතහස්ළු ස්තුතිය

මෙසේ පුද කරමු.






## පදනම

2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ, ශ්‍රී ලංකා විදුහල්පති සේවය 3 පන්තියට බඳවාගත් විදුහල්පතිවරුන් සඳහා විදුහල්පති කෙටිකාලීන විදේශීය පුහුණුව.

## අරමුණ

## පාසල් කළමණාකරණය තුළ නායකත්ව කුසලතා

## Leadership Programme on School BasedManagement

## 15th – 22nd November 2017

## සුවිශේෂ අරමුණු

- මලයාසියාවේ අධ්‍යාපන ක්‍රමය හා එය ක්‍රියාත්මකවන ආකාරය අධ්‍යනය කිරීම මෙන්ම එයින් ශ්‍රී ලාංකේය අධ්‍යාපනයට ලබාගත හැකි ඵලය පිළිබඳ අධ්‍යයන

- නායකත්වය ගුණාංග හා උපක්‍රමික කළමණාකරනය භාවිතය තුළින් නායකත්ව කුසලතා සංවර්ධනය කිරීම.

- අධ්‍යාපන විෂයමාලා සංවර්ධනය අධ්‍යයන තුළින් ශ්‍රී ලාංකේය විෂයමාලා සංවර්ධනයට සවිබලයක් ලබාගත හැකිදැයි අධ්‍යයනය කිරීම.

- අධ්‍යාපන තාක්ෂණය අධ්‍යයනය කිරීම හා ශ්‍රී ලාංකේය අධ්‍යාපන සංවර්ධනයට කෙසේ ලබාගත හැකි ද යැයි අධ්‍යයනය කිරීම.

- 21 වැනි සියවසේ විදුහල්පතිවරයා සතු නායකත්ව කුසලතා සංවර්ධනය හා එහි භාවිතය.

- මලයාසියා පාසල් පද්ධති අධ්‍යනය තුළින් පාසල් කළමණාකරණය පිළිබඳ මූලික දැනුම කුසලතා, ආකල්ප පිළිබඳ අධ්‍යනය කිරීම.

## මලයසියා අධ්‍යාපනයේ ගුණාත්මක භාවය

- මලයාසියා අධ්‍යාපන ක්‍රියාවලිය සරල නොවූත් සංකීර්ණ නොවූත් මධ්‍යස්ථ ක්‍රියාවලියක් තුළ සමාජ නවලෝකයට උචිත වූ ප්‍රායෝගික අධ්‍යාපන ක්‍රියාවලියක ප්‍රතිඵලයකි.

- මලයාසියාවට ම ආවේණික වූ ලක්‍ෂණ විදහා දක්වන ඔවුන්ගේ අධ්‍යාපන ක්‍රමය බහුවාර්ගික අධ්‍යාපනයට කදිම නිදසුනකි.

- එක් භාෂාවක් පමණක් ගොනුකරගත් ඔවුන් රටේ අනන්‍යතාවය ඒ තුළින් විදහා දක්වයි. දමිළ භාෂාව, මැලේ භාෂාව හා ඉංග්‍රිසි භාෂාවද ඔවුන්ගේ ජනප්‍රිය අධ්‍යාපන මාධ්‍ය වේ.
- සියලුම දෙනා අධ්‍යාපන ක්‍රමවේදයට ගරු කරති. හදාරති. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් (රජය) සමස්ත දරුවන්ගේ ප්‍රාථමික, ද්විතික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනය උදෙසා විශාල කාර්යභාරයක් කරයි.

- දරුවන්ගේ ප්‍රාථමික, ද්විතික අධ්‍යාපනය හා වෘත්තීය අධ්‍යාපනයයන අවස්ථා තුනේදීම නොමිලේ අධ්‍යාපනය ලබාදෙයි. තෙවන අදියරේදී තෘතික අධ්‍යාපනය( ජසටයඑැර ඍමජ්එසදබ දර එයසරඑැරහ ඍමජ්එසදබ) පෞද්ගලිකරණය කර ඇත.

- විශ්වවිද්‍යාල සියල්ලම පාහේ පෞද්ගලික අධ්‍යාපනය මත රඳා පවති. ඉතා අඩු වයස් මට්ටමකදී. (අවුරුදු 17) දී පමණ ප්‍රථම උපාධිය ලබන ඔවුන් වැඩි වශයෙන් වෘත්තිය අධ්‍යාපනයට නැඹුරුතාවයක් දක්වයි.

- ඔවුන්ගේ දත්තවලට අනුව නාගරික ප්‍රාදේශවල පමණක් නොව ග්‍රාමීය ප්‍රාදේශවලද සියලු පහසුකම් සහිත පාසල් ඇත. ඒ නිසා අධ්‍යාපන විෂමතාවය අඩු වී ඇත.

- සැමට අධ්‍යාපන සංකල්පය( බහුවිධ ඉගෙනුම් සංකල්පය )ඉතා හොඳින් ක්‍රියාත්මක වේ.

- පාසල් සංස්ථාව තුළ උපදේශනයට වැඩි අවධානයක් යොමුකොට වැඩි පහසුකම් දී ඇත.

- ඒ සඳහා වෙන්කරන ලද ඉඩකඩ පාසල් පද්ධතිය තුළ හොඳින් ව්‍යාප්ත කර ඇත. උපදේශන ගුරුවරයා පාසැලේ ඉමහත් පිළිගැනීමට හා ගෞරවයට පාත්‍ර වී ඇත.විදුහල්පතිට පමණක් උපදේශකවරයා දෙවැනි වේ.

- ජ්‍යෙෂ්ඨත්වය අනුව විදුහල්පති තනතුරු දීමේ පටිපාටියක් එහි ඇත. එය ඉතා උචිතය. නමුත් වැඩකිරීමට හැකි තරුණ ශ්‍රමය වියැකී යාමට ඒ තුළඉඩකඩ නැතුවාම නොවේ.

- නිර්මාණාත්මක චින්තනයට විෂයමාලාව තුළ ඉඩකඩ බොහෝ ලබා දී ඇත. රටට උචිත කාලීනව ගැලපෙන විෂයමලාවක් ඉදිරිපත්කර ඇත.

- වෘත්තිය පුහුණු පාඨමාලාව ප්‍රාථමික අවධියේ සිටම ආරක්‍ෂා කර තිබීම සෑමට යෝග්‍යය. කුඩා කළ සිටම දරුවාගේ හැකියාව සංවර්ධනය කර ගැනීමට ලැබෙන අවස්ථා අතිමහත්ය.

- සමාජයේ කාලීනව ඉල්ලුමක් පවතින වෘත්තිය ඔවුන් හොඳින් අඳුනයි. ඒවාට සරිලන වෘත්තිය කුසලතාව කුඩාකළ සිටම ලබාදෙයි.

- ජාතික විෂයමාලාවන් ක්‍රියාත්මක වෙයි. එය කාලීන අවශ්‍යතාවන්ට අනුව වෙනස්කරනු ලබයි. වෘත්තිය අධ්‍යාපනයේ පූර්ණ සෘජු අයිතිය ඔවුන් සතුව තබාගෙන සමාජයේ ඉල්ලුමට සරිලන දරුවක් නිර්මාණය කරයි.

- විභාග ක්‍රමය වෙනුවට විධිමත් ඇගයීම් පද්ධතියන් ක්‍රියාත්මක වෙයි. ප්‍රායෝගිකය. ක්‍රියාත්මක වන මෙම් ්පැබඑ ක්‍රමය( ඇගයුම්කරණය ) රජය ක්‍රියාත්මක කරයි.

- විභාගය පසුපස හබායන තර!ගකාරී අධ්‍යාපන ක්‍රමවේදයක් දක්නට නොමැත. හැකියාව හා වෙළඳපලේ පවතින ඉල්ලුම අනුව නිර්මාණාත්මක ඇගයීම් ක්‍රමයක් එහි ඇත.

- අමාත්‍යාංශය සතුව මනා නියාමන ක්‍රමවේදයන් ඇත. ඉහළ සිට පහළට ගලායන අධික්ෂණ ක්‍රමවේදය තුළ ස්වයං ලෙස අධික්ෂණ ක්‍රියාවලිය සිදුවෙයි.

- අධ්‍යාපන අමාත්‍යාංශය සියලුම දෙපාර්තමේන්තු හා මනා සබඳතාවයක් පවතී. :ධබැ බැඑඅදරන- ඒ නිසා විෂයමාලාව, පෙළපොත, ගුරුමාර්ගෝපදේශ හා ඉගෙනුම් පල (ධමඑ සදපැ ) හා බැඳි පවතී. එකිනෙක පරස්පර විරෝධි නැත. ඒ සියල්ලගේ එකතුවෙන් නිර්මාණය වූ මනා නිමැවුමක් ඔවුන් සතුව ඇත.

- අධ්‍යාපන වටිනාකම් හා පෙළඹවීම් ඔවුන්ගේ විෂයමාලාව තුළ ඇත. විෂයමාලා කමිටු, ශාස්ත්‍රීය කමිටු, පාලක කමිටු විනිවිධ භාවයෙන් යුකුව ජාතික ප්‍රතිපත්තිවලට අනුව ක්‍රියාත්මක වන බව ඔවුහු පැවසූහ.

- රටට අවශ්‍ය පාසල, අවශ්‍ය විෂයමාලා ප්‍රතිපත්ති  ඔවුන් පහළ මට්ටමේ සිට බලා නිර්මාණය කරයි.

- ප්‍රාථමික අධ්‍යාපන ඉතා විධිමත් ආකාරයට සකසා ඇත. ඉන් අනතුරුව ද්විතික අධ්‍යාපනය ගොඩනගා ඇත.

- ද්විතික අධ්‍යාපනය අවසන් වනවිට බොහෝ විට පොතේපතේ දැනුම පමණක් නොව ප්‍රායෝගිකත්වයටසරිලන ජීවන නිපුනතාවයෙන් හෙබි දරුවකු ඔවුන්ගේ අධ්‍යාපන ක්‍රමය තුළ නිර්මාණය කර ඇත.

- පාසල් පද්ධතිය නිවැරදි හර පද්ධතියක් මත ගොඩනැගුනකි.ආචාර ධර්මවලට අනුකුලව එළඹෙනු තාක්ෂණය උපයෝගි කරගෙන විනයානුකුල පරිසරයන් නිර්මාණය කර ඇත.

- ඔවුන්ගේ අධ්‍යාපන ක්‍රමය තුළින්ම දරුවෝ හික්මවා ඇත. එයට එකම හේතුව ලෙස ඔවුන් සලකනු ලබන්නේ කුඩා කාලයේ සිටම වෘත්තිය පුහුණුව නැඹුරු වූ ක්‍රියාකාකරම් ප්‍රගුණ කරන අධ්‍යාපන ක්‍රමයක් තිබීම බවයි.

- කලබලකාරී දරුවෝ ඇත. ඔවුන් සියල්ලෝම උපදේශනය මගින් නිවැරදි කිරීම් කරයි. පාසල් උපදේශනය විධිමත් ක්‍රම පටිපාටියන් තුළ නිර්මාණය කර ඇත. එහි වැදගත් කම සියල්ලෝම අවබෝධකර ගෙන සිටිති. දරුවෝ ගුරුවරු ප්‍රජාව ඒ පිළිබඳය මනා දැනීමකින් පසුවෙයි.







## අදහස් හා යෝජනා

- අධ්‍යාපන අමාත්‍යංශය සතුව ඇති සියලුම ආයතන (විශේෂයෙන් පාසල් විෂයමාලාව, පරිපාලනය හා සංවර්ධනය) අන්තර් සබඳතාවයන් මත ගොඩ නැගීම ඉතා අගේ කොට සලකමි.

- විවිධ සැලසුම් සකස් කිරීම, විෂයමාලා ප්‍රත්‍යම්පාදනය කිරීම, පොළපොත් සැකසීම, ගුරුමාර්ගෝපදේශ සැකසීම් හා ආයතන පාටිපාටිය සැකසීමේ දී එකිනෙකට පරස්පර විරෝධි නොවන ව්‍යුහයක් තුළ ක්‍රියාත්මන වනවානම් ඉතා අගය කොට සලකමි .

- වගවීම් බහුල විධිමත් කාර්ය පටිපාටියන් සැකසීම ඉතාම උචිතය.

- ඉහළට හෝ පහළට වගකීම් භාරදී තම කාර්ය අවසන් යැයි යන කාර්ය පටිපාටි ක්‍රමය අහෝසි කළ යුතුයැයි විශ්වාස කරමි වගවීමෙන් වැඩකරන සේවා ලැදි පිරිසක් රටට අවශ්‍ය බව මාගේ හැගමයි .

- පාසල් නායකත්වය සවිබල ගැන්විය යුතු අතර එයට අදාළ ජාතික ප්‍රතිපත්ති සැකසීය යුතු බව මාගේ යෝජනාවයි.

- පාසල් නායකත්වය සඳහා පරිනත වයස් සීමා නිර්නය කළ යුතු අතර කුසලතා පෙන්විය හැකි ක්‍රමවේදයන් සැකසීම තුළින් නායකත්වය තෝරා ගත යුතු බව මාගේ අදහසයි.

- ගුරුවරුන්බඳවා ගැනීමේදී පුහුණුව අනිවාර්ය කළ යුතු අතර නුපුහුණු ගුරුවරු පන්තිකාමර තුළ ස්ථානගත නොකළ යුතුය.

- මූලික සුදුසුකම් සපුරාලු ඕනෑම කෙනෙකුට ගුරු වෘත්තීය පාඨමාලා හැදැරීමට අවස්ථාව සලසා දියයුතු අතර ගුරු වෘත්තියට කැමැත්තක් දක්වන වෘත්තීය පුහුණු ලාභීන් පමණක් ගුරු සේවයට බඳවා ගත යුතුය.

- මලයාසියාවේ පාසල්වල ඉහළ නිළධාරීන් තෝරා පත්කරගනු ලබන්නේ ගුරු වෘත්තියේ සිටියොත් පමණි අප ද එය අනුගමනය කළහොත් සුදුසු යැයි යෝජනා කරමි.

- ගුරු උපදේශන සේවය ස්ථාපිත කළ යුතුය. සැබෑ ගුරු උපදේශන තෝරාගත් කුසලතා ක්‍රමයක් මත නිර්මාණය කළ යුතුය. ගුරුවරයාට උපදෙස් ලබාදිය හැකි යථාර්ථවාදී උපදේශකයකු නිර්මාණය කළ යුතුය.

- සෑම දරුවකු තුළම සමාජ වටිනාකම් හැරුණු කොට ගෙන තවත් එක් භාෂාවක් ප්‍රගුණ කිරීමට ආධාර අනුබල දිය යුතුය. රාජය සේවයට බඳවා ගැනීමේදී අනිවාර්යෙන්ම භාෂා 2කට නිපුණත්වයක් ප්‍රායෝගිකව සලකා බැලිය යුතුයි. අන්තර් සබඳතාවයට එය ඉතා අගයේය.

- ශාස්ත්‍රීය විෂයමාලා අඩුකළ යුතු අතර වෘත්තිය විෂයමාලා අංශය වැඩි කොට ප්‍රායෝගික කුසලතා එළි දැක්වීමට විෂයමාලා සංශෝධන කළ යුතු යැයි මාගේ අදහසයි.

- බහුවාර්ෂික අධ්‍යාපනික ක්‍රමය ස්ථාපිත කොට ජාතික ඒකාබද්ධතාවය හා සම අධ්‍යාපනික අවස්ථා පුළුල් කළ යුතුය. ප්‍රායෝගිකව ශ්‍රී ලාංකේය යන ගැනීම ගොඩනැගෙන අධ්‍යාපනික ක්‍රමයන් රට තුළ ස්ථාපිත කළ යුතුය.

- වෘත්තීය අධ්‍යාපනයට යොමුකිරීමේ කුසලතාව අනුව ප්‍රාථමික පාසල තුළින්ම ඇති කළ යුතු අතර පාසල් විෂයමාලාව තුළ වෘත්තිය අධ්‍යාපනය අනිවර්ය කළ යුතුය.

- අධ්‍යාපන තාක්‍ෂණික දැනුම සිසු ගුරු විදුහල්පති යන සෑම දෙනා තුළම සංවර්ධනය කළ යුතු අතර කුසලතා මත වැටුප් වැඩි කර ගැනීමේ හෝ උසස්වීම් ක්‍රමයන් ගුරුවරු විදුහල්පතිවරු තුළ ස්ථාපිත කළ යුතුය.

- අත්දැකීම හා පළපුරුද්දම මුලික දැනුමක් ලබාදිය යුතු අතර ගුරුවරු යාවත්කාලීන කිරීමට ප්‍රායෝගික පුහුණු ඇති කළ යුතුය.

- ශිෂ්‍ය කේද්‍රිය අධ්‍යාපනය ක්‍රමය පමණක් භාවිත නොකර පන්ති කාමරය තුළ ප්‍රායෝගික වූ ක්‍රමවිධි, ස්ථාපිත කළ යුතු බව මලයාසියා පාසල් අධ්‍යයනය තුලින් ප්‍රත්‍යක්‍ෂ විය.





## ශ්‍රී ලංකාවේ දැනට පවතින අධ්‍යාපනික තත්ත්වය වැඩි දියුණු කිරීමට ඉදිරිපත් කළ හැකි ව්‍යාපෘති

ශ්‍රී ලංකාව තුළ තත්කාලීන අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් අත්‍යවශ්‍ය බව පැහැදිලි කරුණකි. මක්නිසාද යත් එග බැරබසබට තත්ත්වයට ලෝකයේ අධ්‍යාපනය ගමන් කර අවසන්ය. වැඩ ලෝකයට උචිත නිපුණතා සංවර්ධනය අත්‍යවශ්‍යය. රටේ පවතින තත්කාලීන අවශ්‍යතාව හා අනාගත ලෝකයේ අවශ්‍යතාව හා අනාගත ලෝකයේ මුහුණ දීමට සිදුවිය හැකියැයි අපේක්ෂණය කරනු ලබන සියලුම ඉල්ලුම්වලට සරලන නිපුණතාවය සපිරි දරුපිරියත් බිහිකිරීමටනම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක අවශ්‍යතාව වැටහෙයි.

දැනට පවතින අධ්‍යාපනික තත්ත්වය වැඩි දියුණු කිරීමට අපට ගතහැකි ක්‍රියාමර්ගය රාශියක් යෝජනා කරමි.

- පාසල් පද්ධතිය තුළ මනාව සංවිධානයට කරන ලද විධිමත් උපදේශන ස්ථාපිත කිරීම.
- පාසල් පරිපාලනය ප්‍රතිව්‍යුහගත කරනයට ලක්කොට නායකත්ව කුසලතා වැඩි දියුණුම (ප්‍රායෝගික වැඩ සටහන් ඇතුළත්ය)
- පාසල් පරිපාලනය හා අධ්‍යාපන පරිපාලනය ස්වාධින ආයතනයක් කර විවිධ බලපෑම්වලට යට නොවූ ස්වාධීන ආයතනයක් ලෙස, දක්ෂතාවයට අනුව උසස්වීම් පටිපාටියක් ඇති කිරීම.
- කාර්යමූල පර්යේෂණ ක්‍රියාවලියක් ගුරුවරයාට, විදුහල්පතිවරුන්ට හා අනේකුත් නිලධාරීන්ට ක්‍රියාත්මක කිරීම.

- සෑම ගුරුවරයකුටම තම කඩඉම් සම්පූර්ණ කිරීමට හෝ වාර්ෂික වැටුප් වැඩිකර ගැනීමට (පියවර) නම් වාර්ෂිකව කාර්යමූල පර්යේෂණයක් අනිවාර්ය කිරීම.

- ජාතික අධ්‍යාපනික ආයතනය ප්‍රතිව්‍යුහගත කරනයට ලක්කොට විධිමත් විෂයමාලා පද්ධතියක් සකස් කිරීම ( මලයාසියාවේ ජාතික අධ්‍යාපන ආයතනය අධ්‍යාපන අමාත්‍යංශයේ කොටසක් ලෙස එහිම ස්ථාපිත කොට ඇත.)

- ගුරුපුහුණු,, විදුහල්පති පුහුණු, අධ්‍යක්ෂවරුන් පුහුණු කිරීම ආදිය විධිමත් රටාවක් ස්ථාපනය කළ යුතු අතර ගුරු මධ්‍යස්ථාන බලවන්තකරණයට ලක්කිරීම.
- ගුරුපුහුණු දේශන කලාව පිටුදැකිය යුතු අතර ප්‍රායෝගික පන්තිකාමරයකට අවශ්‍ය ගුරුවරයා පුරුදු පුහුණු කිරීමේ කාලීන වැඩ පිළිවෙළක් සංවිධානය කළ යුතුය.

- ගුරුවරයාට විදුහල්පතිවරයාට භාෂා දෙකක ප්‍රගුණත්වය අනිවාර්ය කිරීම.

- නිතිරීති මත අධ්‍යාපන ක්‍රමයක් නොව හදවතට දැනෙන අධ්‍යාපන ක්‍රමයකට අප ගමන් කිරීම.

- සාමාන්‍ය පන්ති කාමරය දරුවාට ප්‍රියමනාප, දරුවා සහ ගුරුවරයා අතර අන්තර් සබඳතාවය දියුණු කරන සහෘද ගුරුවරයකු පන්ති කාමරයට හඳුන්වා දීම.

- පාසල් පද්ධතිය තුළ පිරිමි ගුරුවරුන්ගේ සහභාගිත්වය වැඩිකළ යුතුය. සාරධර්ම අධ්‍යාපනික පද්ධතියක් ඇති කිරීම.

- නවීන ලෝකයට උචිත දරුවකු නිර්මාණය කිරීමටනම් නිර්මාජී චින්තනය වැඩි දියුණු කිරීම, පෙර පාසලේ පටන් නිර්මාණ කුසලතා වැඩි කිරීම.

- කියවනවිට ලියන අධ්‍යාපනයට හෝ අකර්මන්‍යව අසා සිට ඉගෙන ගන්නා අධ්‍යාපනය සීමා කොට සහභාගිත්ව නිර්මාණික අධ්‍යාපන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. (වෘත්තිය කුසලතා වැඩිදියුණු කරන අධ්‍යාපනික ක්‍රමයන්)

- පාසල් පරිසරය තුළ පවතින ගැටලු අවම කිරීමට නිර්මාණවලට ළමයා නිරන්තරයෙන් යොමු කරවන, ක්‍රියාකාරකම් බහුල අධ්‍යාපනික රටාවකට දෛනික පන්ති කාමරය හුරුකිරීම.

- ගුරුවරුන්ට හා දරුවන්ට විභාග ක්‍රමය වෙනුවට විධිමත් ඇගයීම් පද්ධතියක් අනිවාර්ය කළ යුතුය. එය වෙනත් බාහිර කණ්ඩායමක් තුළින් නිර්මාණය විය යුතුය.










## <u>තම වෘත්තිය සංවර්ධනය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග</u>

කළමණාකරණ ව්‍යුහය තුළ පාසල් කළමණාකරණය ඉහළම තලයේ විදුහල්පතිවරයා වේ. ඒ නිසා මලයාසියා සංචාරයෙන් හා එහිදී ඉගෙනගත් බොහෝ දැනුම් අතර විදුහල්පති යනු කවරෙක්ද කියා පැහැදිලි වැටහීමක් ලැබුණු බව නොරහසකි. එයි උකහගත් කරුණු ගුරුකොට ගනිමින් විදුහල්පතිවරයකු ලෙස මාගේ වෘත්තිය සංවර්ධනයට පහත සඳහා ක්‍රියා මාර්ග අනුගමනය කළ හැකිය.

1. විදුහල්පති අධ්‍යාපන තාක්‍ෂණ භාවිතය හොඳින් පුරුදු පුහුණු විය යුතු අතර ඒ සියලු කාර්යහි නිපුණතාව ප්‍රගුණකර ගෙන දෛනිකව භාවිතා කළ යුතුය. එහිදී දෛනික කාර්ය තුළ අධ්‍යාපනික තාක්‍ෂණය උපරිමයෙන් යොදාගෙන පාසල් පරිපාලනය කිරීමට යන්න දරමි.

2. විදුහල්පති පාසල් සියලු කාර්යන්හිදී ගර්භිත සන්නිවේදනයහොඳින් භාවිත කළ යුතුය. එනිසා එහි කාර්ය භාරය හොඳින් තේරුම්ගෙන දෛනික පාසල් පරිසරය තුළ මනා සන්නිවේදකයකු ලෙස කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි.

3. විදුහල්පතිවරයෙක් තම වෘත්තිය සංවර්ධනයෟ කරගත යුතුය. භාෂා ප්‍රාගුණය ඇතිකර ගත යුතුය. තම මව් භාෂාවට අමතර ජාත්‍යන්තර භාෂාව :ඇබටකසිය- මනාව ප්‍රගුණ කළ යුතුය. මම ද එය සංවර්ධනය කරමි.

4. විදුහල්පතිවරයා නිරන්තරයෙන් නිර්මාණශිලි චින්තනයෙකු විය යුතුය. :ඤරසඑසජක ඔයසබනසබට- ඒ නිසා පාසලේ සෑම කාර්යන්හිදි නිර්මාණාත්මකව කිරීමට ප්‍රයන්ත දැරිය යුතුය.

5. නිරන්තරයෙන් පාසල් සංවර්ධන කාර්ය කිරීමේදී අධ්‍යයන සේවක මණ්ඩලය ආදි සියලුම දෙනාටම සමානව සළකා කටයුතු කළ යුතුය.

6. විදුහල්පති භූමිකාව සියලු දෙනාව ප්‍රියමනාප භූමිකාවක් මලයාසියාවේදී දක්නට ලැබුණි. පාලකයෙක් කියා අධිරාජ්‍ය රැකගෙන සිටින භූමිකාවට වඩා දරුවන්ට, දෙමාපියන්ට හා ගුරුවරුන්ට ප්‍රිය උපදවන චරිතයක් විය යුතුය.

7. පාසල නිර්මාණය කිරීමේදී ළමුන්ට වැඩි අවස්ථා ලබා දිය යුතුය. මලයාසියා අධ්‍යාපනය තුළ සෑම කාර්යකදීම දරුවා මුලිකව සිටි. අපි ගිය විට මාර්ගෝපදේශ කාර්ය කළේ ද දරුවන් විසිනි. නමුත් අධ්‍යාපන පටිපාටිය ගැන ඔවුන්ට අත්දැකීම් අඩුය. එහෙත් එවැනි ප්‍රශ්න හමුවේ ගුරුවරයකුගේ හෝ පරිපාලනයේ සහය පැතිමට ඔවුන් අවනත කළේ නැත. ඒ නිසා දරුවාට වැඩි අවස්ථා සලසා දිය යුතුය.

8. දරුවාට නිදහසේ ඉගෙන ගැනීමට සැලසිය යුතුය. ඔවුන්ට අවශ්‍ය පහසුකම් ගුරුවරයා සේම රජය ද සැපයීය යුතුය. එවැනි පරිසරයක් තුළ නිතර වැඩ කිරීම නිසා විනය ගැටලුද අවම කර ගැනීමක් එකී සමාජය තුළ දක්නට ලැබුණි. එයද අප පාසල තුළ ක්‍රියාත්මක කිරීම මැනවි.

9. පාසල තුළ උපදේශන කාර්යට ඉහළ ඉල්ලුමක් මෙන්ම යොමුවීමක් ද දක්නට ලැබුණි. උපදේශනය නිරන්තරයෙන් අවශ්‍යව නිසා එය විදුහල්පති විසින් පුර්ණ අධික්ෂණයට හා අවධානයට ලක්විය යුතුය. සෑම පාසලකව අනිවාර්යෙන් ක්‍රියාත්මක කළ යුතුය.

10.

11. නිත්‍යානුකුල, සදාචාරාත්මක සමානත්වයෙන් සලසන පාසලක් ගොඩ නැගීමට නම් විදුහල්පති ස්වාධිනව වැඩ කිරීමට පෙළඹිය යුතුය.



































